දිනය: 2021-10-05
අංකය: 19

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

# මාධ්‍ය නිවේදනයයි
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

දැනට ශ්‍රී ලංකාව තුල රැඳී සිටින විදේශිකයන් ලබා ගෙන ඇති **සියලු වර්ගයේ වලංගු වීසාවන්හි** කාලය **2021 ඔක්තෝබර් 07** වන දින සිට **2021 නොවැම්බර් 06** වන දින දක්වා දින **30** කින් දීර්ඝ කරන ලදී. ඒ අනුව **2021 මැයි 11** වන දින සිට **2021 නොවැම්බර් 06** වන දින දක්වා කාල සීමාව තුළ කල් ඉකුත් වූ වලංගු වීසා සඳහා එම කාල සීමාවට අදාළ වීසා ගාස්තු පමණක් අය කරනු ලබන අතර කිසිදු දඩ මුදලක් අය කරනු නො ලැබේ.

**• සංචාරක වීසා දරන්නන් හට වීසා පිටසන් කර ගැනීමට උපදෙස්;**

ඒ අනුව සංචාරක වීසා දරන්නන් එම වීසා දීර්ඝ කිරීමට අදාළව වීසා ගාස්තු ගෙවීම හා වීසාව පිටසන් කර ගැනීමට පහත ක්‍රමවේදයන් අතරින් එක් ක්‍රමවේදයක් භාවිතා කළ හැක;

1. https://eservices.immigration.gov.lk/vs දරන වෙබ් අඩවියට පිවිස අදාළ ගාස්තු ගෙවා මාර්ගස්ථ ක්‍රමවේදය ඔස්සේ වීසා ලබා ගැනීම හෝ (ශ්‍රී ලංකාවට පැමිණි දින සිට **උපරිම මාස 9ක්** දක්වා);

2. **2021 නොවැම්බර් 06** වන දිනට පෙර දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම් අදාළ වීසා ගාස්තු ගුවන් තොටුපල වෙත ගෙවා දිවයිනෙන් බැහැර වීම හෝ;

3. **2021 නොවැම්බර් 06** වන දින පෙර, බත්තරමුල්ල කාර්යාල වෙත පැමිණ අදාළ ගාස්තු ගෙවා වීසාව ගමන් බලපත්‍රයේ පිටසන් කර ගැනීම.

**• නේවාසික වීසා දරන්නන් හට උපදෙස්;**

**2021 නොවැම්බර් 06** වන දින දක්වා වන වීසා දීර්ඝ කිරීම සියලු වලංගු නේවාසික වීසා දරන්නන් හටද අදාළ වන අතර එදිනට පෙර වීසාව දීර්ඝ කර ගැනීමට රාජකාරි දිනවල පෙ.ව. 8:30 සිට ප.ව. 3:00 දක්වා 0707101050 දරන දුරකථන අංකය අමතා දිනයක් හා වේලාවක් වෙන් කොට ගෙන **2021 නොවැම්බර් 06** වන දිනට පෙර **බත්තරමුල්ල** කාර්යාලයට පැමිණ අදාළ ගාස්තු ගෙවා වීසා පිටසන ලබා ගත යුතු ය.

- **පොදු උපදෙස් හා දඩ මුදල්**

**2021 නොවැම්බර් 06** වන දින දක්වා වන වීසා දීර්ඝ කිරීම පළාත් අතර සංචරණ සීමා පැවතීම හේතුවෙන් සිදුකලද, මින් ඉදිරියට එලෙස වීසා පොදුවේ දීර්ඝ කිරීමක් සිදු කිරීමට අදහස් නොකරයි. පළාත් සංචරණ සීමා පැවතියද වීසා දීර්ඝ කිරීම සඳහා බත්තරමුල්ල කාර්යාලයට පැමිණීමට අවසර ලැබෙන බැවින් මෙරට රැඳී සිටින සියලු විදේශිකයන් **2021 නොවැම්බර් 06 වන දිනට** පෙර ඉහත උපදෙස් අනුව තම වීසා දීර්ඝ කර ගත යුතු වන අතර එදිනට පසුව වීසා නොමැතිව රැඳී සිටීමට අදාළ **දඩ මුදල වන ඇමරිකානු ඩොලර් 500** දඩ මුදල ගෙවීමට යටත් වන බවද දන්වා සිටිමි.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව